ශ්‍රී. බු. ව. 2553 මැදින් මස කලාපය, රා. ව. 2010 ක් වූ පෙබරවාරි 28 වන දින

වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ ගරු යාවජීව සභාපත

**ටී. ඩබ්ලිව්. ඒ. කලපාණ වසන්ත මහතා විසිනි**

***නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!***

# සිව්පසය නුවණැසින් දකිමු.

(මජ්ඣිම නිකාය සබ්බාසව සූත්‍රය ඇසුරින්)

ධර්මකාමී පින්වතුනි,

අද මැදින් පුර පෝ දිනය යි. භාගපවතුන් වහන්සේ බුද්ධත්වයෙන් පසු ඇසළ පෝදා බරණැස දී ප්‍රථම ධර්ම දේශනාව සිදු කොට අට මසක් ගතවිය. ඒ වන විට ගෞතම ශාසනයෙහි භික්ෂූන් වහන්සේලා විසි එක් දහස් තුන්සිය පනස් පස් නමක් (21355) පමණ විය. එපමණ ශ්‍රාවක පිරිසක් පිරිවරා කිඹුල්වත් නුවරට වැඩම කිරීමට ඒ මැදින් පෝදා රජගහ නුවරින් පිටත් විය.

සත්ව සන්තානගතව උපදින කෙළෙසුන් අනුප්පාද වීමට හේතු දේශනා කළ සබ්බාසව සූත්‍රයේ සඳහන් ප්‍රත්‍යවේක්ෂාව පිළිබඳව සරළ විග්‍රහයක් මෙම දහම් පත්‍රිකාවෙන් දක්වන අතර තව තවත් එම දැනුම දියුණු කොට කෙළෙසුන් දුරු වීමෙන් ලබන ඒ අමා සුවයට හේතු සම්පාදනය කර ගැනීම තම තමන්ගේ වගකීමකි.

පිරිත් පොත් වහන්සේගේ ද ඩඩපචචවෙකඛණා" යනුවෙන් යෙදෙනුයේද මෙම ධර්ම පර්යායයි. දෙලොව ආරක්ෂාවට හේතු වන නිසා ද කෙළෙස් බරිත බව අඩු කොට නිරවුල් සිතකින් ආරක්ෂාව තහවුරු කිරීමට පිරිත් පොතට ද අඩංගු කළා විය හැකිය.

සබ්බාසව සූත්‍රයේ ආශ්‍රව හෙවත් කෙළෙස් ප්‍රහාණය (දුරු කිරීම) සඳහා දෙසූ තුන්වෙනි ධර්ම න්‍යාය මෙය යි. ප්‍රත්‍යවේක්ෂාව යනු නුවණින් පරීක්ෂා කිරීම යි. මනුෂ්‍ය දිවි පැවැත්මට ප්‍රත්‍ය

සතරකි. වස්ත්‍ර, ආහාර, නිවාස, බෙහෙත් යනුවෙනි. පැවිදි ජීවිතයට ශාසනික නාමයෙන් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන් පස යනුවෙන් සූත්‍ර පාලියෙහි සඳහන් වෙයි. සිවුපසයෙන් දිවි පවත්වන මනුෂ්‍යා තම ජීවිත පරමාර්ථයන්ට අනුව නුවණින් දකිමින් සිව් පස පරිභෝග කළ යුතුය. නැතහොත් සමාජයට ණය කාරයෙකු බවට පත් වේ.

මෙම සූත්‍රයේ දී ''ජානතෝ - පස්සතො'' නුවණින් දන්නා සහ දකින්නාම ආශ්‍රව ධර්ම ක්ෂය කරන්නේ ය. යනුවෙන් දේශනා කොට ඇත. තව දුරටත් පැහැදිලි කරන්නේ නම් නූපන් දුක් හේතු නූපදින්නත්, උපන් දුක් හේතු දුරු කරන්නත් හේතු වන්නේ යෝනිසෝ මනසිකාරය හෙවත් නුවණැසින් දැකීමයි. අයෝනිසෝ මනසිකාරය යනු එහි විරුද්ධ පැත්තයි. නුනුවනින් දැකීම යි.

ප්‍රත්‍යය සතර මෙනෙහි කිරීම සරලව මෙසේ දැක්වේ.

(1.) ඔඩපටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවතිඔඩ - නුවණින් පරීක්ෂා කොට සිවුරු පරිහරණය කරයි. කෙසේ නුවණින් පරිහරණය කරයි ද? ශීත, උෂ්ණ , මැසි , මදුරු, සුළං, අව්ව ආදියෙන් ද සර්පයන්ගෙන් ද ඇතිවන පීඩා නැති කිරීම පිණිස ද, ලජ්ජා ස්ථාන වැසීමටත් ය.

(2.) ''පටිසඞ්ඛා යොනිසෝ පිණ්ඩපාතං පටිසෙවති '' -නුවණින් මෙනෙහි කොට පිණ්ඩපාතය වළඳයි. එය ක්‍රීඩාව පිණිස, මදය වැඩීමට අලංකාරයට, ලස්සන වීමට නොවේ. ශරීරයේ පැවැත්ම, යැපීම, කුසගින්න නැති කිරීම, බ්‍රහ්ම චරිය රැකීමට අනුබලයට ය. පැරණි බඩගිනි වේදනා නැති කරීමට අලුත් වේදනා නොඉපදවීමට එයින් ජීවිත පැවැත්ම ද නිවැරදි බවද, පහසු වාසයද වන්නේ ය.

(3.) ''පටිසඞ්ඛා යොනිසො සේනාසනං පටිසෙවති'' - නුවණින් මෙනෙහි කොට සෙනසුන සේවනය කරයි. ශීත, උෂ්ණ නැති කිරීම පිණිස, මැසි මදුරු සුළඟ අව්ව සර්ප ස්පර්ෂ, ඍතු පීඩා දුරු කොට විවේකයෙහි ඇලීම පිණිසය .

(4.) ''පටිසඞ්ඛා යොනිසො ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරං පටිසෙවති'' - නුවණින් මෙනෙහි කොට ගිලන් පස බෙහෙත් සේවනය කරයි. උපන්නා වූ නොයෙක් ආබාධ වේදනා නැති කිරීමත් රෝග දුක් නැතිව සිටීම පිණිස පමණකි.

''මහණෙනි, එසේ නුවණින් සිහිනොකරන්නා වූ ඔහුට වෙහෙස සහ දැවිලි සහිත ආශ්‍රවයෝ උපදිති.ඔඩ ප්‍රත්‍යවේක්ෂා කරන්නාට එසේ නොවෙති. මෙසේ වූ කෙලෙස් ප්‍රත්‍යවේක්ෂාවෙන් නැති කල යුතුය.

ගිහි ජීවිතයට ද, තම ජීවිත වෙනසට අනුව ඇඳුම්, ආහාර , නිවාස බෙහෙත් පරිහරණය කළ යුතුය . පැවිදි ආකල්පයන්ට වෙනස් වූ ආකල්ප ගිහියාට ඇත. මෙහි වෙනස එයයි. දස ධම්ම සූත්‍රයේ දී ඔඩඅඤ්ඤො මෙ ආකප්පො කරණීයොතිඔඩ යනුයෙන් පැහැදිලි වේ.

ආකල්ප වෙනස් වුවද දෙපිරිසම ගමන් කරන්නේ අන්තරාය කරවූ ලෝකයක පහස ඉන්ද්‍රිය පහට ගෝචර කරමිනුයි. දුක ඇතිවන්නේ එම තපාය මත හෙයින් නිවන කරා අනිවාර්යයෙන් යා යුතුමය . එම ගමන ගිහියාට සම්බාධ වැඩි හෙයින් ප්‍රමාද ගමනකි. එබැවින් පඤ්ච ශීලය අනුමත කොට ඇත. දෙපිරිසටම එකම ඉලක්කය හෙයින් සසර දුකෙහි ගැඹුර තේරුම් ගැනීම සිව්පසය නුවණින් පරීක්ෂා කොට සේවනය කිරීමමය. කෙළෙස් දුරු කිරීමට එය පිටුවහලකි.

ජීවිතයක පැවැත්ම සඳහා සිව්පසය අත්‍යාවශ්‍යමය. එහෙයින් ගිහි පැවිදි දෙපිරිසට මේ සඳහා ක්‍රම වේද දෙකකි. සිය ජීවිත කාලයම මේ සඳහා ගිහියා කැප කරති. එහෙත් සෑහීමකට පත් වූ කෙනෙකු පුහුදුන් සමාජය තුළ නැත. කෙලෙස් දුරු කොට මග ඵල ලැබූ උතුමෝ පමණක් සුවපත් වූහ. ඒ නිසයි අප තෙරුවන් සරණ ගොස් සිව්පසය නුවණින් පරීක්ෂා කොට සේවනය කල යුත්තේ.

බුදුරජාණන් වහන්සේගේ දර්ශනය වන්නේ තෘෂ්ණාව සහමුලින් දුරු කිරීමයි. එය පරම සැපයයි. තෘෂ්ණාව උපදින හේතූන් ලෙස සිව්පසය දක්වා ඇත. සිව් පසයෙන් උපදින තෘෂ්ණාව සිව්පසයෙන්ම නුවණින් දැක දුරු කල යුතුය. ඒ සඳහා සංවරය හෙවත් සීලය පසුබිම් කර ගත යුතුයි. ගිහියන් වන අපද කාරණයට නුසුදුසු පරිදි පිනෙන් පිරිහෙන පරිදි පව වර්ධනය වන පරිදි වැරදි ලෙස සිතයි නම් නුවණින් නොදැකීමයි. දිළින්දෙක් තමන් මොනවා හරි කරල ජීවත්විය යුතුයි කියා දැහැමි රැකියාවක් නැති කමට පස් පව් හෝ වංචා අල්ලස් දූෂණ කිරීමට සිතයි නම් යෝනිසෝ මනසිකාරය ඔහු තුල නැත. ඔහු අවසිහියෙන් මුලාවීමකි. ජීවත් වීමට යමෙක් යහපත් මාර්ගයක් කල්පනා කොට අධර්මයෙන් ජීවත් වීමට වඩා දැහැමි වීම ඇතිව දිළිඳු වුවද යහපතකැයි සිතිම යෝනිසෝ මනසිකාරය යි. පැවිදි ජීවිතයක් ලැබෙන සිව්පසයෙන් සෑහීමකට පත් නොවී ශික්ෂාපද කැඩීමට නොමනා ජීවත්වීමකට සිතයි නම් එය අයෝනිසෝ මනසිකාරය යි. සිව්පසය අඩුවෙන් ශික්ෂාපද රකිමින් දුකසේ ජීවත් වීමට සිතීම

නුවණින් පරීක්ෂාකර ජීවත් වීමකි. එ බැවින් බුදු හිමියන්,ඔබමහණෙනි, යමකින් නූපන් අකුසල් උපදී ද උපන් කුසල් පිරිහේ ද, මේ අයෝනිසෝ මනසිකාරය යම් ලෙසක් ද එවැනි වෙනත් ධර්මයක් මම නොදනිම්ඔබ යි වදාළහ. කාරණයට අනුව මෙනෙහි නොකරයි ද එතැන නූපන් අකුසල් උපදී උපන් අකුසල් වැඩි මරණින් මතු දුගතියෙහි උපදී.

දැන් පැහැදිලියිං ගිහි පැවිදි භේදයකින් තොරව තෘෂ්ණාව උපදින්නාවූ සිව්පසය සිහිනුණින් පරිහරණය නොකළ විට අපි කාහටත් ඇතිවන තත්වය. එබැවින් සිව්පසය පරිහරණයේදී සංවරකම සීලාචාරකම ඇතිකරගත හොත් නුවණින් දැකිය හැකි වනු ඇත.

නුවණින් සිත මෙහෙයවා වස්ත්‍ර, ආහාර, නිවාස, බෙහෙත් පරිහරණය කොට රැක ගැනීමට හදන්නේ කුමක් ද? මම සහ මගේ ආත්මය යි. එලෙසින්ම ගත් රූපය යි. ප්‍රත්‍යවේක්ෂාවේදී හෙවත් නුවණින් පරීක්ෂා කරන ප්‍රඥාවන්තයා ඒ නුවණට මමය මාගේය

ආත්මය යි කියා ගත් රූපය ලක් විය යුතුය. ඇඳුම් නොඇඳීමෙන්, ආහාර නොගැනීමෙන්, බෙහෙත් නොගැනීමෙන්, මැසි මදුරුවන්ට අව්වට වැස්සට සීතලට ගොදුරු වුනොත් මගේ කයට කුමක් වේද? මේ රූපකාය තුළ සිදුවන්නේ කුමක් ද? වෙනස් වීමයි. විපරිනාමය යි. ඒ වෙනස්වීම නිසා රූපය යයි . අන්වර්ථ නාමයකින් ද හඳුන්ව යි.

අහාර ටිකක් ඇසට දැකීමෙන් වස්ත්‍රයක් නිවසක් කාම සැපයක් ඇති කරන වස්තූන් දැකීමෙන් එයින් අපේ සිත සැප බලාපොරොත්තු වෙනව. මුලදී සඳහන් කල දේශණා පාඨයෙහි සඳහන් ශිත නැති කිරීම, උෂ්ණ නැති කිරීම, ලජ්ජා ස්ථාන වැසීම, බඩගිනි වැලැක්වීම ශරීර පැවැත්ම, වේදනා නැති කිරීම ආදිවූ හේතු එකක්වත් සිතට නොපැමිණේ. ඇඳුමක් දුටු විගස කය ලස්සන කිරීමට සුන්දර කිරීමට අඹුදරුවන්ටත් ඒ සැපය දීමට කෙසේ හෝ උත්සාහ කිරීමයි. එයින් සිදු වන්නේ නූපන් කෙලෙස් ඉපදීමයි. උපන් කෙලෙස් වර්ධනය යි. නුවණින් පරික්ෂා කිරීම යනු සිව්පසය ඉදිරියේ දී දණින් නොවැටෙන පිළිවෙතක් විමසීමයි. මාතෘකා දේශනා පාඨයෙන් අපට ලබා දෙනුයේ ඒ පණිවුඩය යි.

කාමභෝගී ගිහියා කම්සැප විඳිය යුතුය. සීමාව ඉක්මවා යෑම බුදුදහම අනුමත නොකරයි. පංච ශීලයෙහි තුන්වෙනි ශික්ෂාපදය එයට සාක්ෂි සපයයි. කාමයෙහි වරදවා නොහැසිරවීම යි. පැවිද්දා වේගවත්ව කෙලෙස් දුරු කරයි. ගිහියා ප්‍රමාදී වෙයි. බිය ඇත්තේ ගිහියා ලගයි. ප්‍රසිද්ධියේ පවු කරන ගිහියා හිමිනමකගේ සුළුවරද විවේචනය කරයි නම් ඒ අණුවන කමකි. තමන් ළග වැරදි මහා ගොඩක් බව නොවැටහේ.

වත්මන් සමාජයේ සිව්පසය පිළිබඳව නුවණින් පරික්ෂා කිරීමක් ඉටු නොකරයි. සාධාරණය අසාධාරණය නොවිමසයි. ඇතැම් විට ගිහියාගේ ඇඳුම මැසි ,මදුරු, සපී ආදී සතුන්ගෙන් වන හානි වැලැක්වීමට නොව ඇතැමුන් අඳින ඇඳුමෙන් සතුන් ද කලබල වන ලජ්ජා ස්ථාන පෙන්වන ඇඳුම් ය. එම ඇඳුම් පරිහරණය නුවණින් පරික්ෂා කලේ නම් එසේ වන්නේ නැත. නුවණින් දැකීමට සීලයක් සංවරයක් සිත තුළ පැවතිය යුතුය. සූත්‍ර පාඨයේ පරමාර්ථයන්ට අනුව කයෙහි වෙනස් වීම විපරිනාමය නම්, එම වේගයට වඩා ඇඳුමෙහි විපරිනාමය වේගවත් වී ඇත. චාම් සරළ බවින් ඈත් වී ඇත.

අහාර වාසස්ථාන බෙහෙත් වුව ද සිහි නුවණින් පරිහරණය කිරීමක් නොපෙනේ. අතීතයේ දී භික්ෂූන් වහන්සේලාගේ ආකල්පයන්ට සමාන සිව්පස පරිභෝගයක් තුල ගිහියා ජීවත් වූවා සේ දැකිය හැක. නීරෝගිභාවය ආයු සම්පත් විඳීම සාක්ෂි ලෙස සිතිය හැක. නුවණින් දැක සිව්පසය පරිහරණය කරන්නේ නම් වෙළඳ රැවටීම් වලට හසු නොවේ. ආයු, වර්ණ, සැප, බල රැකේ. රසයට මුලාවී අලංකාරයට මුලාවි ක්ෂණික තෘප්තියට මුලාවී සෞඛ්‍යයත් ධනයත් දෙකම නැති කර නොගනී. ජාතික ආගමික අවස්ථාවන්හි දී මේ දුර්වලකම හොඳින් දැකිය හැක. සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර එවැනි අවස්ථාවකි. එම දින කීපය සිහිනුවණින් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම කටයුතු නොකිරීමෙන් බොහෝ අලාභ සහ පිරිහීම් මෙන්ම අකුසල් ද සිදුකර ගනී.

ප්‍රශ්‍රාවන්තව සිව්පස පරිහරණය නොකිරීමෙන් මූලික අරමුණ මතකයෙන් ද ඈතට ගොස් ඇත. අද බොහෝ දේ සඳහා මූලික අරමුණ නැති කාරණයට අනුව නුවණින් පරීක්ෂා නොකිරීම පිරිහීමට හේතු වී ඇත. ඔහු හෝ ඇය ණය කාරයෙකු වී සිතෙහි අසහනයද ඇතිකර ගනී.

සිව්පසයෙහි ගිජුවූ භික්ෂුවක් අරභයා දේශනා කළ ජාතක පොතෙහි සඳහන් වන චක්කුවාක ජාතකයේ බෝධිසත්ව සක්වා ලිහිණියා වාසය කරන නෙළුම් විලෙහි සෙවෙල් අනුභව කොට පරපණ නොනසා දිවි පැවැත්ම රන්වන් ශරීරයකට හේතු විය. සත්ව මාංශ අනුභව කරමින් සක්වා ලිහිණි රූ සපුවට ඊර්ෂපාකල කෑදර කපුටාගේ අශෝභන පෙනුම අධර්ම දිවි පෙවෙතේ ප්‍රතිබිම්බය ලෙසින් දැක්වේ.

නොයෙක් ආහාරයෙන් නොව කමී, චිත්ත, ඍතුවෙනුත් ශරීර වැඩීමට හේතු වන බවද ආයුෂය, වර්ණය සැපය බලය කටුක ආහාරයෙන් අඩීමයෙන් නොලැබෙන බවද බෝසත් සක්වා ලිහිණියා පසක් කළේය. (චක්‍රවාක හෙවත් සක්වා ජාතකය කියවා දැන ගත යුතුයි.)

ලෝකයේ බෙහෙත් වර්ග කොතෙක් තිබුණ ද ඒ සියල්ල මනුෂ්‍ය ජීවිතයට ප්‍රත්‍ය වුවද ගුණධර්ම නැමැති බෙහෙත සංසාර රෝගය ද සුවපත් කරති. බුදු හිමි කල ජීවත් වූ ධනංජානි බමුණා අසාධාරණයට යොමු වූයේ දෙවෙනි බිරිඳගේ සිව්පස පරිභෝජනයේ වැරැද්ද හේතුවෙනි. පළමු බිරිඳ ලෙඩකදි සිහි නුවණින් අත් බෙහෙතකින් සෑහිමකට පත් විය. දෙවෙනි බිරිඳ විශේෂඥ වෛද්‍ය ප්‍රතිකර්ම සඳහාම එකවරටම යොමුවීම බමුණා අධර්මයට ඇද දැමීය. එයින් නූපන් අකුසලයන් ඉපදීමක් උපන් අකුසල් වැඩි දියුණු කිරීමටත් අයෝනිසෝ මනසිකාරය යෙදවීමයි. ගුණවන්ත බමුණා පත් වී ඇති තත්වය දුටු සැරියුත් මා හිමියෝ බමුණාට පිහිට විය. පරිභෝග කල සිව් පසයට ද උන්වහන්සේ ණය කාරයෙකු නොවීය. දායකයාට මෛත්‍රියෙන් පිහිට විය. බමුණා ද අසාධාරණ සිව්පස ඉපයීමෙන් මුදවා සැපවත් කළේ ය.

පැවිදි ජීවිතය නිරන්තරව සිව්පසය නුවණින් දැක කෙලෙස් දුරු කරති. ගිහියන් ද සාධාරණව සිව්පසය උපයා පරිහරණය කරමින් පොහෝ දිනටවත් නුවණින් පරීක්ෂාකොට හඬනගා කියා වාක්‍යයට සීමා නොකොට ක්‍රියාවෙන් අවබෝධය කර ගෙන කෙලෙසුන් ප්‍රහීණ කොට සැනසීමට අදිටන් කර ගනිමු.

wwwlakruhunu.com